www.kotuwegedara.com දැනුම
පමනක් ඇති අඩවිය

## PHP Functions

අපට System Date එක ලබාගැනීමට අවශ්‍ය මොහොතක අප විසින් date යන Function එක මීට ප්‍රථම අවස්ථාවක අප විසින් භාවිතා කරන ලදි. මෙසේ ක්ෂණිකව අවශ්‍යතා උදෙසා PHP භාෂාවේ අභ්‍යන්තරයේ Function 700 කට අධික සංඛ්‍යාවක් දැකගත හැකි අතර මෙම Function අපගේ අවශ්‍යතා පරිදි භාවිතා කල හැකිය. මෙම Funcntion නොයෙක් වෙබ් අඩවි වලින් සොයාගත හැකි අතර ඔබ විසින් අන්තර්ජාලය භාවිතයෙන් මෙම Function සොයාගැනීමට උත්සාහ ගන්න. එසේම අපගේ ඇතැම් අවශ්‍යතා සඳහා අපටම මෙම Function සකසා ගැනීමේ හැකියාව පවතින අතර ඔබ විසින් මීට ප්‍රථම JavaScript පාඩමේදී Function සැකසීම උගත් අතර ඔබට මේ පිලිබඳව හොඳ අවබෝධයක් ඇතැයි මා සිතමි.



## Function එකක් සැකසීමේ රීතීන්

1. PHP Function එකක් ආරම්භ වනුයේ function() යන වචනයෙන්ය.

2. Function එකක ක්‍රියාවලිය Function නාමයෙන් විස්තර කිරීමට උත්සාහ ගත යුතු අතර නමක් ආරම්භ කල යුත්තේ underscore ලකුණකින් පමනක් විය යුතුය.

3. සගල වරහන් වලින් අරබා අවසන් කල යුත්තේද සඟල වරහනකින්ය. මේ තුල අපගේ Function එකට අදාල විධාන පෙළගැස්විය හැකිය.

කුඩා Function එකක් සකසා එය ක්‍රියාත්මක කරවන ආකාරය පිලිබඳව විමසා බලමු. මෙහිදී මගේ නම දර්ශණය කිරීම සඳහා Function එකක් සකසා ඇති අතර එය ක්‍රියාත්මක කරන ආකාරය අවබෝධ කොට ගන්න.

```
<html>
<body>
<?php
    function writeMyName()
        }
    echo "Pradeep Kavinda";
        }

    writeMyName();
?>
</body>
</html>
```

Function එක සැකසීම

Function එක ක්‍රියාත්මක කිරීම

11

PHP script එකක් සමග Function එකක් ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මීලඟට විමසා බලමු.

```
<html>
<body>
<?php
function writeMyName()
  {
  echo "Pradeep Kavinda";
  }
echo "Hello world!<br />";
echo "My name is ";
writeMyName();
echo ".<br />That's right, ";
writeMyName();
echo " is my name.";
?>
</body>
</html>
```

ඉහත විධාන පෙලගැස්ම ක්‍රියාත්මක කල පසුව එය පහත පරිදි දර්ශණය වේ.




ඉහත උදාහරණයේ නම ලෙස සටහන් කල Kavinda යන්න අපගේ අවශ්‍යතාවය මත වෙනස් කල නොහැකිය. සාමාන්‍යයෙන් Fucntion එකක් වෙනස් කල හැකි කොටස් වලින් සමන්විත විය යුතුය. මෙවැනි වෙනස් කල හැකි කොටස් වලට අප Parameter කියා හඳුන්වන අතර Function එකක ඇති මෙම Parameter කොටස අපට අවශ්‍ය පරිදි වෙනස් කරගත හැකිය. පහල දැක්වෙන උදාහරණය අවබෝධ කොට ගන්න.

www.kotuwegedara.com දැනුම එමතින් ඇති අඩවිය






ඉහත උදාහරණයෙහි $fname ලෙස ඇති Parameter එක වෙත Function එක ක්‍රියාත්මක වීමට උපදෙස් නිකුත් කරන අවස්ථාවේදී ලබාදුන් අගය ස්ථාපිත වී ඒ අනුව ක්‍රියාත්මක වන ආකාරය අවබෝධ කොට ගත හැකැයි සිතමි. සාමාන්‍යයෙන් Function එකක Parameter එකකට වඩා වැඩි සංඛ්‍යාවක් ආදේශ කොටගත යුතු විටක ඒ සඳහා එම Parameter වෙන් කිරීම සඳහා කොමා ලකුණ භාවිතා කල හැකිය.

මීලඟට දැක්වෙන උදාහරණයෙහි Parameter දෙකක් භාවිතා කර ඇති ආකාරත් එය ක්‍රියාත්මක කල විට දැක්වෙන ආකාරයත් දැකගත හැකිය. එය නිවැරදිව අවබෝධ කොට ගන්න.



```
<html>
<body>
<?php
function writeMyName($fname,$punctuation)
  {
echo $fname . " Kotuwegedara" . $punctuation . "<br />";
  }
echo "My name is ";
writeMyName("Pradeep ","...");
echo "My name is ";
writeMyName("Kavinda","!!!");

?>
</body>
</html>
```



Function එකකට අගයන් ආදේශ කොට වෙනස් ම වූ පිලිතුරු වෙත යාම සඳහා Function එකක් තුල return යන විධානය භාවිතා කල හැකිය. මෙමගින් Function එකෙහි අභ්‍යන්තරයේ වන ගනිතමය හෝ වෙනත් ක්‍රියාවලියක් පිටතට ගෙන ආ හැකිය පහත උදාහරණයෙහි 1 හා 16 එකතු කිරීම සඳහා Function එකක් සකසා ගෙන ඇති ආකාරය දැක්වේ.



```
<html>
<body>
<?php
function add($x,$y)
  {
  $total = $x + $y;
  return $total;
  }
echo "1 + 16 = " . add(1,16)
?>
</body>
</html>
```



www.kotuwegedara.com දැනුම එකතු ඇති අඩවිය



වඩා ප්‍රායෝගික ගණිතමය හා වෙනත් ක්‍රියාවලීන් සඳහා PHP හී Function භාවිතා කල හැකිය. ඔබ විසින් ඉහත හඳුනාගත් මෙම පහසුකම් භාවිතා කොට වඩා නිර්මාණශීලි හා සරල ආදේශයන් ලබාගැනීමට උත්සාහ ගන්න.

## Form එකකින් තොරතුරු ලබාගැනීම හා Form එකක් වෙත තොරතුරු ගෙනයාම.

වෙබ් අඩවියක ඇතැම් වෙබ් පිටුවලින් User ගෙන් ලබාගන්නා තොරතුරු Webserver එක වෙත ගෙන යාම කරනු ලබන අතර එම තොරතුරු පදනම් කොට ගෙන User වෙත නොයෙක් අදහස් හා විධාන නිකුත් කරනු ලබයි. මේ සඳහා PHP හී ඇති $_GET, $_POST හා $_REQUEST යන විධාන භාවිතා කල හැකිය. HTML Form එකක් මගින් තොරතුරු Webservr එකක් වෙත ගෙන යා හැකි අතර සාමාන්‍යයෙන් HTML Form එකක ඇති ඕනෑම කොටසක් (Element) PHP මගින් ලබාගැනීමේ හැකියාව ඇත. මෙනිසාම User ගේ අවශ්‍යතා පදනම් කොට වඩා නිර්මාණශීලී හා User අවශ්‍යතා වලට වඩා ගැලපෙන නිර්මාණ අපට කල හැකිවේ.

මීට ප්‍රථම පරිච්ඡේදයේද Form එකක් සකසන අයුරු හැදෑරූ ඔබට පහත දැක්වෙන උදාහරණය අවබෝධ කොට ගත හැකියැයි සිතමි.

```
<html>
<body>
<form action="welcome.php" method="post">
        Name: <input type="text" name="name" />
        <br>
        Age : <input type="text" name="age" />
        <br>
        <input type="submit" />
</form>
</body>
</html>
```




ඉහත රූපයේ පරිදි අප වෙත ලැබුණු Form එකෙහි අප විසින් ඇතුලත් කරනු ලබන නම හා වයස Submit බොත්තම තේරූපසුව Welcome.php යන පිටුව වෙත ගෙන යාම සඳහා <form action="welcome.php" method="post"> ලෙස Form එක ආරම්භයේ සටහන් කර ඇත. Submit බොත්තම තේරූ පසුව welcome.php වෙබ් පිටුව දර්ශණය වේ.

පහත විධාන සටහන් කොට welcome.php යන නමින් එය ගබඩා කොට ඉහත සැකසූ වෙබ් පිටුව ක්‍රියාත්මක කොට බලන්න. එවිට එය මීලඟ රූපයේ පරදි දැක්වෙනු ඇත.

```
<html>
<body>
Welcome <?php echo $_POST["name"]; ?>.<br />
You are <?php echo $_POST["age"]; ?> years old.
</body>

</html>
```

www.kotuwegedara.com






## Cookie

අප මීට ප්‍රථම JavaScript පිලිබඳ හැදෑරීමේදී Cookie යන්න පිලිබඳව සරල අවබෝධයක් ලබාගන්නා ලදි. Cookie එකක් PHP භාවිතා කොට සැකසීම සඳහා setCookie යන Function එක භාවිතා කල හැකිය. සාමාන්‍යයෙන් Cookieඑකක් සඳහා නමක් තිබිය යුතු අතර එය සකසනු ලබන අවස්ථාවේදීම එම cookie එකෙහි ගබඩා කරනු ලබන අගයද සටහන් කල හැකිය. එසේම cookie එකක් විනාඩි කිහිපයක්, දිනයක් හෝ දින කිහිපයකින් පසුව ගබඩාවූ web Browser එකෙන් ඉවත් කිරීම කල හැකි අතර කොපමන කාලයක් Web Browser එකෙහි තිබිය යුතුද යන්න දැක්වීමද සකසනු ලබන අවස්ථාවේදීම සටහන් කරනු ලබයි.

පහත උදාහරණයෙන් login යන නමින් cookie එකක් සැකසෙන අතර එහි Pradeep යන නාමය ගබඩා කරනු ලබන අතර දැනට පරිගණකයෙහි ඇති වේලාව ලබාගෙන එයට 3600 ක් එක්කොට ඇති අතර මෙය ක්‍රියාත්මක කල පසුව login නමින් cookie එකක් Web Browser එකෙහි සැකසෙන අතරම සැකසුනු වේලාවේ සිට පැයක කාලයක් cookie එක ක්‍රියාත්මකව පවතී.

cookie එකක් සැකසීමේදී HTML Tag ආරම්භ කිරීමට ප්‍රථම එය කල යුතුය.

```
<?
    setCookie("login","Pradeep",time()+3600);
?>

<html>
<body>
    <h1> Cookie is written </h1>

    <a href="next.php">click here to view the   cookie
data        </a>

</body>
</html>
```

cookie එකක ගබඩා කල අගයක් කියවීම සඳහා $_COOKIE[] යන array එක අපට භාවිතා කල හැකිය. පහත උදාහරණය මගින් ඉහත අප විසින් සැකසූ login යන cookie එක හඳුනාගෙන එය භාවිතා කරනු ලබන ආකාරය දැක්වේ. ඔබ විසින් වෙබ් අඩවි සැකසීමේදී cookie එකක් වඩා ප්‍රයෝජනවත්ව භාවිතා කල හැකිය.

```
<html>
<body>
<h2> Reading cookie data </h2>
<?
    $cval = $_COOKIE["login"];
    echo "Cookie Value : $cval";
?>
</body>
</html>
```

www.kotuwegedara.com දැනුම



## Session

Online Business, Shopping Cart යන වචන ඔබ මීට ප්‍රථම අසා ඇතුවාට සැකනැත. වෙබ් අඩවියක් භාවිතා කොට පාරිභෝගිකයන් වෙත භාන්ඩ අලෙවි කිරීමේ ක්‍රියාවලිය කිරීමේදී එක් පාරිභෝගිකයෙකු විසින් ඉල්ලුම්කරනු ලබන භාන්ඩ හෝ සේවාවන් පිලිබඳ තොරතුරු අලෙවි ක්‍රියාවලිය අවසන් වන තුරු තබාගත යුතුය. මෙහි අපහසුතාවය වනුයේ පාරිභෝගිකයන් සංඛ්‍යාව විශාල වූ පසුව එකම අවස්ථාවේදී පාරිභෝගිකයින් කිහිපදෙනෙකු භාන්ඩ කිහිපයක් ඉල්ලුම් කිරීමේදී කුමන පාරිභෝගිකයා කුමන භාන්ඩය ඉල්ලුම් කලාද යන්න පිලිබඳ තොරතුරු තබාගැනීමේ හැකියාව වෙබ් අඩවිය සතුවිය යුතුය. මෙම ක්‍රියාවලිය කිරීම Session Handling ලෙස හඳුන්වයි.

සාමාන්‍යයෙන් Online Business වෙබ් අඩවියකින් භාන්ඩ මිලදී ගැනීමේදී පාරිභෝගිකයෙකු විසින් වෙබ් අඩවියට පිවිස එක් එක් භාන්ඩ තෝරාගැනීමෙන් අනතුරුව එය මිලදී ගන්නා බව තහවුරු කල යුතු අතර පසුව මෙම භාන්ඩ සඳහා මුදල් ගෙවනු ලබන ආකාරය හා භාන්ඩ එවිය යුතු ස්ථානය අප සටහන් කල යුතුය.

ඉහත අප හඳුනාගත් Online Business වෙබ් අඩවියක් සැකසීමේදී Session යන පහසුකම භාවිතා කල හැකිය. මෙය ඉතා කුඩා ක්‍රියාවලියක් නොවන අතරම Session Handling දීර්ඝව විස්තර කල යුතු කොටසකි. නමුත් අප මෙම කෘතියේදී මේ පිලිබඳව කුඩා අදහසක් පමනක් ලබාගැනීමට උත්සාහ ගනිමු.

පහත දැක්වෙන උදාහරණය මගින් Session Variable එකක දත්ත ගබඩා කරනු ලබන ආකාරය දැක්වෙන අතර ඉන් පසු උදාහරණයෙන් ගබඩා කල Session Variable කියවනු ලබන ආකාරය දැක්වේ.



```
<?
//creating session variables
```

```
        session_register("username");
        session_register("age");
        session_register("login");

//assign values to session variables
        $_SESSION["username"]="saman";
        $_SESSION["age"]="50";
        $_SESSION["login"]="yes";
?>
<html>
<body>
<h2>Session variables are created </h2>
<a href="ses2.php">Click here to verify session data
</a>
</body>
</html>
```

## Session Varible වල සටහන් කල තොරතුරු ලබාගැනීම

```
<?
        session_start();
?>

<html>
<body>
<h2> Reading session variables </h2>
<?

        $uname=$_SESSION["username"];
        $age=$_SESSION["age"];
        $log=$_SESSION["login"];

//print the values
```

www.kotuwegedara.com



```
        echo " <h5>user Name : $uname </h5>";
        echo " <h5>age       : $age </h5>";
        echo " <h5>Login status : $log </h5>";
?>
</body>
</html>
```

ඉහත උදාහරණයේදී සටහන session_start(); යන්න HTML Tag වලට ප්‍රථම සටහන් කර ඇති අතර මෙමගින් session හඳුනාගැනීමක් කරනු ලබයි.

## Database Priogmming

PHP විධාන භාවිතා කරනු ලබන ආකාරය පිලිබඳව සරල අවබෝධයක් ලබා ගත් අප PHP සමඟ MySQL දත්ත ගොනුවක් සම්බන්ධ කොට ගන්නා ආකාරයත් වෙබ් පිටුවක ඇතුලත් කරනු ලබන දත්ත හා තොරතුරු MySQL Table එකක ස්ථාපිත කොටගන්නා ආකාරයත් MySQL Table එකක ඇති දත්ත වෙබ් පිටුවක දර්ශණය කරගන්නා ආකාරයත් පිලිබඳව විමසා බලමු.

PHP භාෂාව මගින් ලෝකයේ මේ වන විට භාවිතා වන ප්‍රධාන දත්ත ගොනු මෘදුකාංගය විස්සකට ආසන්න ප්‍රමාණයක් සමඟ සම්බන්ධථා ඇති කොට ගැනීම සඳහා පහසුකම් අතර මෙයින් MySQL, PostgreSQL, හා Oracle මින් විශේෂ තැනැක් ගනී. අප මේ වන විටත් MySQL භාවිතා කරනු ලබන ආකාරය පිලිබඳව හදාරා ඇති අතර MySQL හී Table එකක් සකසා ගන්නා ආකාරය හදාරා ඇති අතර මෙම Table එක වෙත වෙබ් පිටුවක් හරහා දත්ත ගෙන ගොස් ගබඩා කරනු ලබන ආකාරය පිලිබඳව විමසා බලමු. මේ සඳහා අප විසින් මේ වන විටත් Practical යන නමින් සකසාගෙන ඇති Database එකෙහි ඇති User යන Table එක භාවිතා කරමු. මෙහි Uname,Address,MailNo නමින් Field තුනක් ඇති අතර මෙම Field වලට අවශ්‍ය තොරතුරු එක් රැස්

කිරීම සඳහා පහත රූපයේ දැක්වෙන ආකාරයේ වෙබ් පිටුවක් userdata.html නමින් නිර්මාණය කරගනිමු.




ඔබ මෙවැනි වෙබ් පිටුවක් සකසා ගැනීමේදී අප මීට ඉහත පරිච්ඡේදයේදී උගත් Form එකක් ආකාරයෙන් සකසා ගැනීමට සිදුවෙන අතර මෙහි භාවිතා කරනු ලබන Elimentසඳහා අප විසින් ලබාදෙනු ලබන නම් ඉතා වැදගත් වේ. මෙම Form එක සැකසීමට භාවිතා වන HTML විධාන පහත පරිදි පෙලගස්වා ඇති අතර එහි භාවිතයන් සරලව හදුනා ගනිමු. මෙහිදී මෙම Form එක සඳහා නමක් භාවිතා කොට ඇති අතර මෙහිදී method ="post" ලෙස සටහන් කොට ඇත. මෙහි අදහස වනුයේ මෙම Form එක තුල සටහන් කරනු ලබන තොරතුරු වෙනත් තැනකට ගෙන යා යුතු බවය. මෙහි action ="savedate.php" ලෙස කොටසක් ඇති අතර මෙහි අදහස වනුයේ මෙම තොරතුරු ගෙන යා යුත්තේ මෙම savedata.php යන php පිටුවට බවය. මෙසේ විධාන පෙලගැස්වූ පසුව වෙබ් පිටුවෙහි සටහන් කරනු ලබන තොරතුරු මෙම වෙබ් පිටුවෙහි ඇති Save Data නමින් ඇති submit බොත්තම තේරූ පසුව savedata.php පිටුව වෙත ගෙන යනු ලැබේ.

www.kotuwegedara.com දැනුම එකතැන් ඇති අඩවිය



```
<html>
<body>
<h2>User Details</h2>
<hr>
<form name="form1" method="post" action=
"savedata.php">
<table width="550" border="0" cellspacing="0"
cellpadding="0">
  <tr>
    <td width="153">User Name </td>
    <td width="397"><input type="text" name="uname"></
td>
  </tr>
  <tr>
    <td> Address </td>
    <td><input type="text" name="uadd"></td>
  </tr>
  <tr>
  <td>Email Number </td>
  <td><input type="text" name="uemail"></td>
  </tr>
</table>
<input type="submit" name="submit" value="Save
Data"><br>
</form>
</html>
```

ඉහත පරිදි සකසා ගත් වෙබ් පිටුව ක්‍රියාත්මක කිරීමෙන් පසුව අප විසින් එහි සටහන් කරනු ලබන තොරතුරු savedata.php පිටුව වෙත අවසානයේ ලැබෙනු ඇත. මා විසින් සැකසූ savedata.php යන පිටුවෙහි ඇතුලත් HTML හා PHP විධාන එකින් එක අවබෝධ කොට ගනිමු. මෙහිදී MySQL ගොනුවේ ඇති User යන Table එකෙහි අප විසින් සටහන් කල තොරතුරු

ගබඩා කරනු ලබන ආකාරය පිලිබඳව විමසා බලමු. මෙහි විධාන ආරම්භ කිරීමට ප්‍රථම ඉන් වන ක්‍රියාවලිය විස්තර කර ඇති අතර එය නිවරදිව අවබෝධ කොට ගන්න.

```
<html>
<body>
<h2>Your Information</h2>
<?
```

අප විසින් මීට ප්‍රථම වෙබ් පොරමයේ ඇතුලත් කල දත්ත සියල්ල මෙම වෙබ් පිටුව වෙත ලැබෙන අතර අප විසින් එකින් එක හදුනාගෙන එම දත්ත Variable වල ස්ථාපිත කොට ගත යුතුය. පහත අප $name, $add, $email ලෙස Variable තුනක් සකසා ගෙන ඇති අතර මෙහි ඉහත වෙබ් පෝරමයෙන් ලැබෙන තොරතුරු ගබඩා කොට ගනී. මෙහිදී ඪරසඉකැ නාමයට පසුව සමාන කිරීමේ ලකුණට පසුව $_REQUEST[" යන්නට පසුව ඉහත වෙබ් පෝරමයේ Eliment වලට යෙදූ නම් භාවිතා කොට ඇත. මෙහිදී $name= $_REQUEST["uname"]; යන විධාන පෙලගැස්මෙන් ඉහත වෙබ් පොරමයේ uname යන නමින් සැකසූ Eliment එකින් නිකුත් වූ තොරතුර $name යන Variable එකෙහි ස්ථාපිත කොට ගෙන ඇත. පහත විධාන තේරුම් ගන්න.

```
$name= $_REQUEST["uname"];
$add= $_REQUEST["uadd"];
$email= $_REQUEST["uemail"];
```

අප විසින් තාවකාලික ගබඩා ස්ථාන වල දත්ත සටහන් කරගැනීමෙන් අනතුරුව මෙම දත්ත ස්ථිරව ගබඩා කිරීම සඳහා දත්ත ගොනුව විවෘත කොට ගනිමු. මෙහිදී MySQL දත්ත ගොනුව විවෘත කිරීමට පහත පරිදි විධාන ලබාදිය හැකිය.

```
mysql_connect("localhost","root","");
```

www.kotuwegedara.com දැනුම එකතු ඇති අඩවිය



මෙහි "root" යනු Webserver එකෙහි User ලෙස අප යොදා ඇති නාමයවේ. මෙහිදී user විසින් දත්ත ගොනුවට ඇතුලත් වීමට භාවිතා කල යුතු රහස් කේතය (Password) මීලඟට සටහන් කල යුතුවේ. ඉහත "root", යන්නට පසුව Root යන User විසින් Password එකක් භාවිතා නොකරන බැවින් මෙම "" ලකුණු පමනක් භාවිතා කොට ඇති අතර යම් ලෙස කිසින් Password භාවිතා කොට තිබුනි නම් එය සටහන් කල යුතුය.

අප විසින් දත්ත ගොනුව හා සම්භන්ධ වූ පසුව එහි ඇති User යන table එක විවෘත කොට ගැනීම සඳහා පහත පරිදි විධාන පෙලගැස්විය හැකිය.

```
mysql_select_db("user");
```

ඉහත විධානයෙන් user යන Table එක විවෘත වන අතර insert into යන SQL විධානය මගින් ඉහත Varible තුල සටහන් කොට ඇති තොරතුරු user Table එකෙහි ගබඩා කල හැකිය. පහත දැක්වෙන විධාන පෙලගැස්ම අවබෝධ කොට ගන්න.

```
//write the sql statement
$sql ="insert into students
        values('$name','$add','$email')";
```

ඉහත SQL එක ක්‍රියාත්මක කිරීමට පහත විධානය සටහන් කරන්න

```
//execute SQL
$result = mysql_query($sql);
?>
<hr>
<h5>Data Entered successfully</h5>
<a href="userdata.html">
 Click here to go the form</a>
<a href="displaydata.php">
 Click here to display data</a>
```

```
</body>
</html>
```

## දත්ත ගොනුවක සටහන් කල තොරතුරු වෙබ් පිටුවක් වෙත ලබාගැනීම.

සාමාන්‍යයෙන් වෙබ් පිටුවක රූප අකුරු හා වෙනත් නිර්මාණ ඇතුලත් වන අතරම දත්ත ගොනුවක සටහන් කොට ඇති දත්ත වලින් ලබාගන්නා තොරතුරුද තිබිය හැකිය. අප විසින් මීට ප්‍රථම අවස්ථාවේ User Table එකෙහි ඇතුලත් කොට ගනු ලැබූ දත්ත වෙබ් පිටුවක් වෙත ගෙනවිත් එය දර්ශණය කරගන්නා ආකාරය පිලිබඳව විමසා ලබමු. පහත දැක්වෙන විධාන සටහන් කර එය ක්‍රියාත්මක කොට මෙහි ක්‍රියාවලිය අවබෝධ කොට ගන්න.

```
<html>
<body>
<h1>User Data </h1>
<?
```

User Table එකෙන් දත්ත ගෙන ඒම සඳහා පලමුව MySQL හා සම්බන්ධ විය යුතු අතර ඒ සඳහා පහත පරිදි විධාන සටහන් කරන්න.

```
mysql_connect("localhost","root","");
```

User Table එක ස්ථාපිත කොට ඇති practical දත්ත ගොනුව හා සම්බන්ධ වීම සඳහා පහත පරිදි විධාන පෙලගැස්විය හැකිය.

```
mysql_select_db("practical");
```

User Table එක විවෘත කොට ගැනීම සඳහා පහත පරිදි SQL විධාන භාවිතා කල හැකිය.

```
$sql ="select * from user";
$result=mysql_query($sql);
```

www.kotuwegedara.com



User Table එක විවෘත කොට ගැනීමෙන් අනතුරුව එහි ඇති දත්තයන් වෙබ් පිටුවට ගෙන ඒම සඳහා පහත පරිදි විධාන සටහන් කල හැකිය.

මෙහිදී User Table එකෙහි එක් එක් Record වල තොරතුරු ලබාගෙන ඇත.

```
while($row=mysql_fetch_array($result,MYSQL_BOTH))
    {
        $na=$row["Uname"];
        $ad=$row["Address"];
        $eno=$row["MailNo"];
        echo " Name          : $na <br>" ;
        echo " Address       : $ad <br>" ;
        echo " Email No      : $eno <br>";
        echo "<hr>";
    }
?>

<a href="Userdata.html">Click here to go the form</a>
</body>
</html>
```

## File හැසිරවීම

PHP භාවිතා කොට Text ගොනු සැකසීමටත් එම ගොනු වල දත්ත ගබඩා කිරීමටත් ගබඩා කල දත්ත නැවත භාවිතය සඳහා ලබාගැනීම ආදී ක්‍රියාවලීන් අපට කල හැකිය. එසේම Directory සැකසීම හා ඉවත් කිරීම ආදී ක්‍රියාවලීන්ද කල හැකිය.


11

මේ සඳහා PHP Function භාවිතා කල හැකි අතර මෙම Function වල භාවිතායන් උදාහරණ මගින් අවබෝධ කොට ගනිමු.

## Directory(Folder) එකක් සැකසීම

මේ සඳහා mkdir යන්න භාවිතා කල හැකිය. මෙහි ආකෘතිය පහත දැක්වේ.

mkdir("Directory නාමය");

මෙහිදී අප ලබාදෙනු ලබන නමින් Folder එකක් Web Server එකෙහි සැකසේ. උදාහරණයක් ලෙස mkdir("TestDirectory") ලෙස සටහන් කලහොත් ඔබගේ Web Server Folder එකෙහි TestDirectory නමින් Folder එකක් සැකසේ.

## File එකක් සැකසීම හා මකා ඉවත් කිරීම

File එකක් සැකසීම සඳහා touch යන Function එක භාවිතා කල හැකිය. මෙහි ආකෘතිය පහත පරිදි වේ.

touch("File නාමය");

නමින් File එකක් Web Server එකෙහි සැකසේ. උදාහරණයක් ලෙස touch("myinfo.txt"); ලෙස සටහන් කලහොත් ඔබගේ Web Server Folder එකෙහි myinfo.txt නමින් File එකක් නොමැති නම් මෙම නමින් ගොනුවක් සැකසේ.

File එකක් මකා ඉවත් කිරීම සඳහා unlink යන Function එක භාවිතා කල හැකිය. මෙහි ආකෘතිය පහත පරිදි වේ.

unlink("File නාමය");

මෙහිදී Web Server Folder එකෙහි මෙම ලබාදුන් නමින් ගොනුවක් ඇත්නම් එය මැකීයනු ඇත.

www.kotuwegedara.com දැනුම
පමනක් ඇති අඩවිය



## File එකක් විවෘත කිරීම හා වසා දැමීම

Text ගොනුවක දත්ත සටහන් කිරීමට හෝ එහි ඇති දත්ත කියවීම සඳහා මුලින්ම එම ගොනුව විවෘත කොට ගත යුතුය. මේ සඳහා fopen යන Function එක පහත ආකෘතියේ දැක්වෙන පරිදි භාවිතා කල හැකිය.

fopen("ගොනුවෙහි නාමය","විවෘත කරනු ලබන කාරණය");

මෙහිදී මෙම ගොනුව විවෘත කොට ගනුයේ කවර කාරණයක් සඳහා ද යන්න ආරම්භයේදී දැන්විය යුතු බැවින් පහත දැක්වෙන කොටස් ඒ සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.

| | |
|---|---|
| r | කියවීම සඳහා පමනක් විවෘත කරගැනීමට |
| r+ | කියවීම හා ලිවීම සඳහා විවෘත කරගැනීමට |
| w | ලිවීම සඳහා පමනක් විවෘත කොටගත හැකි අතර යම් ලෙසකින් ලබාදුන් නාමයෙන් ගොනුවක් නොමැතිනම් ගොනුවක් සකසන ලබයි. |
| w+ | කියවීම හා ලිවීම සඳහා විවෘත කොටගත හැකි අතර යම් ලෙසකින් ලබාදුන් නාමයෙන් ගොනුවක් නොමැතිනම් ගොනුවක් සකසනු ලබයි. |

## fopen Function එක සඳහා උදාහරණයක් බලමු

```
<?
    $fp=fopen("first.txt",'w+')
?>
```

11

මෙසේ ඉහත පරිදි fopen Function එක සටහන් කොට ක්‍රියාත්මක කල පසුව first.txt නමින් ගොනුවක් තිබේනම් එම ගොනුව විවෘත්ත වන අතර එම නමින් ගොනුවක් නොතිබුනි නම් w+

යන්න සටහන් කොට ඇති බැවින් එම නමින් අලුතින් ගොනුවක් සැකසේ.

විවෘත කොටගත් ගොනුවක් වසා දැමීම සඳහා fclose යන Function එක භාවිතා කල හැකිය. ගොනුවක් විවෘත්ත කොට ගැනීම හා වසා දැමීම සඳහා Fopen හා fclose Function පහත උදාහරණයේ පරිදි සටහන් කල හැකිය.

```
<?
        $fp=fopen("first.txt",'w+');
        fclose=($fp);
?>
```

### විවෘත කොට ගත් ගොනුවකින් තොරතුරු ලබාගැනීම

ඉහත ඔබ හඳුනාගත් fopen Function එක සටහන් කල පසුව ගොනුවක් විවෘත වන නමුත් එම ගොනුවෙහි සටහන් කර ඇති තොරතුරු දර්ශණය නොවේ. ඒ සඳහා එම ගොනුවෙහි ඇති තොරතුරු හඳුනාගෙන පසුව එම තොරතුරු දර්ශණය කොට ගත යුතුය.

ගොනුවක සටහන් කොට ඇති තොරතුරු හඳුනාගැනීමට (කියවීමට) fgets() යන Function එක භාවිතා කල හැකිය. මෙම Function එක මගින් Text File එකක එක් පේලියක් එක අවස්ථාවකදී කියවනු ලබයි. මෙම Function එකෙහි ක්‍රියාවලිය හඳුනාගැනීම සඳහා පහත ක්‍රියාකාරකම කොට බලන්න.

මීට කලින් උදාහරණය ක්‍රියාත්මක කලේ නම් මේ වන විටත් text.txt නමින් Text File එකක් ඔබගේ Web Server Directory එකෙහි සැකසී ඇති බව ඔබට දැකගත හැකිවේ. ඔබ විසින් මෙම ගොනුව විවෘත කොට ඔබ නම සටහන් කොට ඔබගේ ලිපිනය පෙලින් පෙල සටහන්කොට ගබඩා කොට ගන්න පසුව පහත

www.kotuwegedara.com



දැක්වෙන ආකාරයෙන් PHP විධාන සටහන් කොට අලුතින් PHP ගොනුවක් සකසා ක්‍රියාත්මක කොට බලන්න.

```
<HTML>
<HEAD>
<?
$filename="text.txt";
$fp=fopen($filename,"r");

while(!feof($fp))
{
$line=fgets($fp);
print "$line<br>";
}

fclose($fp);
?>

</HEAD>
```

මෙම විධාන පෙලගැස්වීමෙන් සකසා ගන්නා PHP ගොනුව ක්‍රියාත්මක කල පසුව ඔබ විසින් සටහන් කරන ලද නම හා ලිපිනය text.txt ගොනුවෙහි සටහන් කල ආකාරයෙන්ම දැකගත හැකිවේ.

මෙහිදී print යන විධානය මගින් වෙබ් පිටුවෙහි ලීවීමේ ක්‍රියාවලිය කොට ඇති අතර fgets යන Function එක මගින් text.txt ගොනුවෙහි සටහන් කොට ඇති තොරතුරු කියවීමේ කාර්යයත් කරනු ලබන බව ඔබට තේරුම් ගත හැකිවේයැයි සිතමි. fgets යන Function එක එක් පේලියක් පමනක් කියවා අවසන් වන බැවින් එය while යන Loop එක තුල සටහන් කොට ඇත. මෙහි !feop යන සටහනෙන් loop එක ගොනුව අවසන් වන තුරු ක්‍රියාත්මක වන ලෙස උපදෙස් ලබාදීම කර ඇත. මේ තුල fgets යන Function එක සටහන් කොට අතර මෙම fgets යන Function එක මගින් එක් පේලියක් කියවීම කරනු ලැබුවද එය while යන Loop එක තුල සටහන් කොට ඇති බැවින් ගොනුවෙහි සියලු

පේලි අවසන් වන තුරු ක්‍රියාත්මක වන බව ඔබට වටහා ගත හැකිවනු ඇත.

සාමාන්‍යයෙන් වෙබ් පිටුවක් වරින් වර වෙනස් කිරීම වෙනුවට text file එකක් වෙනස් කොට එහි ඇති තොරතුරු වෙබ් පිටුවක් වෙත ලබාගැනීම සඳහා ප්‍රායෝගිකව ඉහත හඳුනාගත් උදාහරණය භාවිතා කල හැකිය.

## Text File එකක දත්ත සටහන් කිරීම.

Text file එකක යම් කිසි දත්තයක් සටහන් කිරීම සඳහා අපට fwrite යන Function එක භාවිතා කල හැකිය. මෙම සටහන් තැබීමට ප්‍රථම අදාල text File එක විවෘත කොට ගෙන තිබීම අවශ්‍ය වේ. පහත උදාහරණය සටහන් කොට ක්‍රියාත්මක කොට බලන්න.

```
<?
	$filename="text.txt";
	$fp=fopen($filename,"w+");
	fwrite($fp,"Hello from PHP");
	fclose($fp);
?>
```

ඉහත උදාහරණය ක්‍රියාත්මක කල පසුව text.txt ගොනුවෙහි Hello from PHP ලෙස සටහන් වී ඇති ආකාරය දැකගත හැකිවේ.

ඔබ විසින් මෙතෙක් උගත් PHP විධාන භාවිතා කොට Web Server එකක් තුල දත්ත ගොනු සකසා ඉන් තොරතුරු ගැනීමටත් Text ගොනු හැසිරවීමත් කල හැකි අතර මේ වන විට උගත් සියලු විධාන ප්‍රායෝගික අවශ්‍යතා උදෙසා ආදේශ කොට ගැනීමට උත්සාහ ගන්න. PHP භාෂාවෙහි ඇති සියලු විධාන මෙවැනි කුඩා කෘතියකින් විස්තර කිරීමට නොහැකි නමුත් අන්තර්ජාලය ඔස්සේ PHP පාඩම් ලබාගනිමින් දැනුම වර්ධනය කරගැනීම සඳහා උනන්දු වන්න.

www.kotuwegedara.com දැනුම